# මනෝකායික රෝගීන්ගේ මානසික පසුබිම දිගු කාලීන ව ප්‍රතිකාර ගන්නා නමුත් සාර්ථක සුවයක් නොලද කායික රොගීන් ඇසුරින් සමීක්ෂණාත්මක ව අධ්‍යයනය කිරීම

උපතිස්ස එච්. ඒ. එස්. එස්.[1], විතාරන පී.[2]
[1]ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
[2]චිකිත්සා අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

**සංක්ෂිප්තය**

මනෝකායික රෝගීන්ගේ මානසික පසුබිම දිගු කාලීන ව ප්‍රතිකාර ගන්නා නමුත් සාර්ථක සුවයක් නොලද කායික රෝගීන් ඇසුරින් සමීක්ෂණාත්මක ව අධ්‍යයනය කිරීම" යන මැයෙන් මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා හේතු වූයේ වර්තමාන සෞඛ්‍ය ගැටලු අතර දක්නට ලැබෙන ඇතැම් කායික ලක්ෂණ පෙන්වන ව්‍යාධීන්ට සෘජු කායික සම්බන්ධයක් නැති බව පැහැදිලි වීමත් ඒවාට මූලික ම හේතුව වන්නේ මානසික බලපෑම් බව පර්යේෂණ සහ සායනික අධ්‍යයනවල දී අනාවරණය වී තිබීමත් ආයුර්වේද ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ගෙන් යම් ප්‍රමාණයකට මෙම රෝග තත්ත්වයන් පැතිර පැවතීමත් ය. පර්යේෂණයට අවශ්‍ය දත්ත ලබාගැනීම සඳහා වික්‍රමාරච්චි ආයුර්වේද රෝහලේ බාහිර රෝගී අංශයට යොමු වන රෝගීන් හා නේවාසික ව ප්‍රතිකාර ලබන රෝගීන් අතරින් පුරාණ කායික රෝගාබාධ සහිත රෝගීන් තිස් දෙනෙකු යොදා ගන්නා ලදී. ඒ සඳහා මනෝකායික රෝගීන් සම්බන්ධ පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා ජාත්‍යන්තරයේ භාවිත කරන DCPR දර්ශකය භාවිතයෙන් සිංහල භාෂාවෙන් ගොඩනගන ලද ප්‍රශ්නාවලියක් භාවිත කරන ලදී. එහි අන්තර්ගත කරුණුවලට අමතර ව ශ්‍රී ලංකාවේ සුලබ මනෝ සාමාජීය ගැටලුවක් වන සියදිවි නසා ගැනීම සම්බන්ධ මානසික තත්ත්වයන් විමසීම සඳහා තවත් අතිරේක ප්‍රශ්නයක් ද එම ප්‍රශ්නාවලිය තුළට අන්තර්ගත කරන ලදී. ඉන් ලබා ගත් දත්ත වගුගත කර ඒවායේ ප්‍රතිශත අනුව ස්ථම්භ ප්‍රස්ථාර භාවිත කර නිගමනවලට එළඹෙන ලදී. මේ අනුව දිගු කාලීන ව කායික රෝග සඳහා ප්‍රතිකාර ගන්නා නමුත් එම රෝගයන්හි සාර්ථක සුවයක් නොලද රෝගීන්ගේ මානසික පසුබිම හා කායික රෝගී තත්ත්වය අතර සම්බන්ධයක් පවතින බව තහවුරු විය.

**ප්‍රමුඛ පද:** මනෝකායික රෝග, මානසික පසුබිම, දිගු කාලීන කායික රෝග

**විද්‍යුත් ලිපිනය:** Shanisanda89@gmail.com